**ශීර්ෂ 278 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය රත්නපුර - විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) | අයගම | (උ) | කලවාන | (ක) | නිවිතිගල |
| (ආ) | ඇලපාත | (ඌ) | කහවත්ත | (ග) | පැල්මඩුල්ල |
| (ඇ) | ඇහැලියගොඩ | (එ) | කිරිඇල්ල | (ජ) | බලංගොඩ |
| (ඈ) | ඇඹිලිපිටිය | (ඒ) | කුරුවිට | (ට) | රත්නපුර |
| (ඉ) | ඉඹුල්පේ | (ඔ) | කොලොන්න | (ඩ) | වැලිගෙපොල |
| (ඊ) | ඕපනායක | (ඕ) | ගොඩකවෙල | | |

### 1.1 විගණන විෂය පථය

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජූනි 04 දින එම කාර්යාලයේ ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථා, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධාන, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා

සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 753ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 724ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු. මිලියන 29ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 4ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 584 | 578 | 6 | 1 |
| මූලධන | 169 | 146 | 23 | 14 |
| **එකතුව** | **753** | **724** | **29** | **4** |

#### (ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 27 කින් හා දෙපාර්තමේන්තු 20 කින් සමාලෝචිත වර්ෂය සඳහා පිළිවෙලින් රු.මිලියන 3,469 ක් හා රු.මිලියන 1,758 ක් වශයෙන් එකතුව රු.මිලියන 5,227 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත එවා තිබුණි. එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මිලියන 2,940 ක් හා රු. මිලියන 1,674 ක් වශයෙන් එකතුව රු.මිලියන 4,614 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිය පිළිවෙලින් රු.මිලියන 529 ක් හා රු.මිලියන 83 ක් වශයෙන් රු.මිලියන 613 ක් වී තිබුණි. එක් එක් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් උපයෝජනයන් කළ පසු ඉතිරිය සියයට 0 සිට සියයට 66 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **විෂය අංකය** | **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|---|
| | **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 27801 | 50 | 49 | 32 | 44 | 200 | 157 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අංක 6003/0000/00/0054/0000/000 දරන තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 616 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3.1 ඡේදයේ සිට 3.13 ඡේදය දක්වා වූ ඡේදවල දක්වා ඇත.

**3. ශීර්ෂ 278 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර**

**3.1 විසර්ජන ගිණුම**

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම නිසා උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 ක ප්‍රමාණයක් වී තිබුණි.

**3.2 පොදු තැන්පත් ගිණුම**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක වර්ෂ 2ක් ඉක්ම වූ එකතුව රු. 599,532ක් වූ තැන්පතු 12ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 571(1) පරිදි සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම මුදල් රෙගුලාසි 570හි දක්වා ඇති පරිදි ඉකුත් වූ සියළුම තැන්පතු පිළිබඳ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

----------------------------------------------------------------------

විෂය අංක 27801 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 2,745,066 ක් වූ අතර, එම හිඟහිටි ශේෂවලින් වර්ෂ 2 කට වැඩි වර්ෂ 5 කට අඩු කාල පරිච්ඡේදයට අයත් හිඟහිටි ශේෂ එකතුව රු.152,590 ක් වී තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විටත් හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

(ආ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් සිදුකර තිබුණු වැරදි හර කිරීමක් නිසා 2014 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව වූ හර ශේෂය හා භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව වූ හර ශේෂය අතර රු. 238,090 ක වෙනසක් පැවතුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

----------------------------

ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වටිනාකම තක්සේරු කර නොතිබුණු ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් හෙක්ටයාර් 0.34ක ඉඩමක් 1998 වර්ෂයේ සිට භාවිතයට ගෙන තිබුණි.

**3.5 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

--------------------------------------------------------------

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම් පිළිබඳව අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

**--------------------------------------------**

ගිවිසුම්ගත සමිති විසින් ඉදිකිරීම් කටයුතු පැහැර හැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණු එකතුව රු.884,447ක් වූ ව්‍යාපෘති 04 ක් ආරම්භ කර නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඇස්තමේන්තුගත පිරිවැය රු.399,670ක් වූ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණ ද, ශිවිසුම්ගත සංවිධානයේ අකාර්යක්ෂමතාව නිසා එම ව්‍යාපෘතිය නිම නොකර අතහැර තිබුණි.

### 3.6 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ කාර්යයන්

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) කොළොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 14 කණුව සිට නන්දනගම දක්වා මාර්ග ඉදිකිරිම සඳහා රු.767,929 ක් වැය කර තිබුණි. එම ඉදි කළ මාර්ගයේ ස්ථාන 03ක කොන්ක්‍රීට් තට්ටුව පුපුරා තිබුණු අතර තවත් ස්ථාන දෙකක යොදා තිබුණු කොන්ක්‍රීට්වල ශක්තිමත් බව අඩුවී තිබුණි.

(ආ) වැලිගෙපොල, පනාන සේවා පියසේ රු.25,248ක් වැය කර පාදිකාවක් (Pavement) ඉදිකර තිබුණි. එහි සුද මැදු කපරාරුව සම්පූර්ණයෙන්ම බොල් වී තිබුණි.

(ඇ) වැලිගෙපොල, ලේකම්ගොඩ දෙයියන්ගෙ කුඹුර මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු. 177,863 ක් වැය කර තිබුණි. එම මාර්ගයට යොදන ලද 1:3:6 (37.5mm) කොන්ක්‍රීට් මිශ්‍රණය නියමිත ප්‍රමිතියට නොතිබීම නිසා එහි කළුගල් පහසුවෙන් කොන්ක්‍රීට් තට්ටුවෙන් ගැලවී වෙන් වී තිබුණි. මාර්ගයේ සමහර ස්ථානවල කොන්ක්‍රීට් සුසංහසනය කිරීම අඩු වී තිබුණු බව බළංගොඩ විධායක ඉංජිනේරු විසින් ද, ලිඛිත ව දන්වා තිබුණි.

(ඈ) ළමා ලේකම් කාර්යාලයෙන් ලද ප්‍රතිපාදන උපයෝගී කරගෙන බලංගොඩ, ඉඹුල්පෙ, කලවාන, කොලොන්න හා වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වන පෙර පාසල්වල සිසුන් සඳහා නැවුම් කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහනට පෙර පාසැල් තෝරාගත් පදනම විගණනයට පැහැදිලි කර නොතිබුණි. එම කොට්ඨාශවල වූ මුළු පෙර පාසල් ළමුන් සංඛ්‍යාවට අනුව 2013 හා 2014 වර්ෂවල දී පිළිවෙලින් සියයට 30ක් හා සියයට 26 ක් වන පරිදි ඉතා අඩු ළමුන් සංඛ්‍යාවකට මෙම සහනය ලබා දී තිබුණි .

### 3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ඉඹුල්පේ, කලවාන, වැලිගෙපොල, කුරුවිට සහ කොලොන්න යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදු කළ කර්මාන්ත 09ක ඉටු කර නොතිබුණු වැඩ වෙනුවෙන් රු. 510,507ක් ගෙවා තිබුණි.

## 3.8 මෙහෙයුම් දුර්වලතා

-----------------------

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ආපදා සහන සේවා කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. එම ප්‍රතිපාදනවලින් 2012 වර්ෂයේදී හානි වූ නිවාස යළි ගොඩනැංවීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් මගින් ප්‍රතිලාභීන් 06 දෙනෙකුට පළමු වාරිකය ලෙස එකතුව රු.125,200 ක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක ප්‍රතිලාභීන් තිදෙනෙකුට දෙවෙනි හෝ තෙවන වාරික ලෙස එකතුව රු.190,000 ක් ලබා දී තිබුණි. එම ආධාර කිසිදු ඉදිකිරීමේ කාර්යයකට යොදවා ගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 3.9 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) කුකුලේගඟ ජල විදුලි යෝජනා ක්‍රමයේ ප්‍රධාන පිවිසුම් මාර්ගයට 1997 වර්ෂයේ දී ඉඩම් හෙක්ටයාර 5,765 ක් අත්පත් කර ගෙන තිබුණි. ඒ සඳහා වන්දි ගෙවීමට අවුරුදු 16ක් ප්‍රමාදවීම නිසා වන්දි පොලී ලෙස රු.1,909,617ක් ගෙවා තිබුණි. රජයේ මණ්ඩලයක වූ දුර්වල ක්‍රියාකාරීත්වය නිසා වන්දි පොලී ගෙවීමට සිදු වූ බව දිස්ත්‍රික් ලේකම්වරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ආ) අදාල පාර්ශව විසින් ගිවිසුමකට එළැඹීමකින් තොරව හා ගෙවිය යුතු බදු කුලිය පිළිබඳ නිශ්චිත එකඟතාවක් ද රහිතව රත්නපුර පැරණි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල තුළ රජයේ කාර්යාල 08ක් පවත්වා තිබුණි. රජයේ අධිකාරියක් සතු යැයි පිළිගෙන තිබුණු ඉන් එක් ගොඩනැගිල්ලක් 2013 වර්ෂය අවසානයේ දී එම අධිකාරිය වෙත නැවත ලබා දීමට එකඟ වී තිබුණ ද, එය ඉටු වී නොතිබුණි. කෙසේ නමුත්, මෙම ගොඩනැගිල්ල පිළිබඳ කිසිදු නෛතික අයිතිවාසිකමක් රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නොමැති බව දිස්ත්‍රික් ලේකම්වරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

## 3.10 අනාර්ථික ගනුදෙනු

-----------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළැඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) තන්ජන්තැන්න විහාරස්ථානය සමීපයේ යෝජිත බුදු පිළිමයක් වෙත යාමට පඩිපෙළක් ඉදි කිරීමට රු. 151,136 ක් ගෙවා තිබුණ ද, බුදු පිළිමයක් ස්ථාපනය කර නොතිබීම නිසා පඩිපෙළ ඉදි කිරීමට වැය කළ මුදල නිෂ්ඵල වී තිබුණි.

(ආ) බෝක්කුවක් සහිත උඩගම වැටකොළලන්ද මාර්ගය ඉදි කිරීමේ දී විධිමත් අනුමැතියක් රහිතව අනුමත ඇස්තමේන්තුවට වඩා වැඩිපුර ඉදිකිරීම නිසා ඒ සඳහා ගෙවූ රු.144,250 ක් අනාර්ථික විය.

**3.11 නිෂ්ඵල වියදම්**

-----------------

රතු ලූනු වගාවේ අවාසි අඩුකර ගොවීන්ට තෘප්තිමත් විය හැකි ආදායමක් ලබාගත හැකිවන පරිදි බල්බ වෙනුවට සත්‍ය බීජ මගින් රතු ලූනු වගාව ව්‍යාප්ත කිරීමේ අරමුණ ඇතිව 2013 වර්ෂයේ දී රතු ලූනු බීජ නිෂ්පාදන වැඩසටහන ආරම්භ කර තිබුණි. ඒ අනුව, රතු ලූනු බල්බ කි.ග්‍රෑ. 7500ක් වගා කර සත්‍ය බීජ කි.ග්‍රෑ. 1500ක් නිපදවා ගැනීමටත් ඒවා අක්කර 500 ක වපසරියක වගා කර එමගින් රු.487,500,000ක් වටිනා රතු ලූනු කි.ග්‍රෑ. 3,250,000ක අස්වැන්නක් ලබා ගැනීමට අපේක්ෂා කර තිබුණි. මේ සඳහා 2013 වර්ෂයේ දී රු.1,359,500ක් වැය කර රතු ලූනු බල්බ කි.ග්‍රෑ. 7,500 ක් මිල දී ගෙන ඒවා කොලොන්න හා ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පදිංචි ගොවීන් 64 දෙනෙකු අතර බෙදා හැර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සැපයුම්කරුවන් තෝරා ගෙන ඇණවුම් කිරීමට එක් මසක් ද, ඇණවුම් කළ ලූනු බල්බ ලැබීමට මාස 2 ½ ක් ද ප්‍රමාද කර තිබුණි.

(ආ) ගොවීන් 08 දෙනෙකු වෙත බල්බ කි.ග්‍රෑ. 976 ක් නිකුත් කළ බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දන්වා තිබුණ ද, කි.ග්‍රෑ. 350 ක් පමණක් ඔවුන් වෙත ලැබී තිබුණි. මේ නිසා රු. 95,343ක් වූ බල්බ කි.ග්‍රෑ. 526 ක් අස්ථානගත වී තිබුණි.

(ඇ) මෙම බල්බ ගොවීන්ට නොමිලේ බෙදා දීමට තීරණය කර තිබුණ ද ගොවීන් 10 දෙනෙකුගෙන් රු. 33,820ක් ලබා ගෙන තිබුණි.

(ඈ) වගා කළ කි.ග්‍රෑ. 7,500 බල්බවලින් කිලෝ ග්‍රෑම් 1:7 සිට 1:15 දක්වා පරාසය තුළ අස්වැන්නක් ලබාගත් බව අදාළ කෘෂිකර්ම සහකාර අධ්‍යක්ෂවරුන් විසින් විගණනය වෙත දන්වා තිබුණ ද, කි.ග්‍රෑ. 3,250,000ක අස්වැන්නක් ලබා ගැනීමට අපේක්ෂා කළ මෙම ව්‍යාපෘතියෙන් ලබාගත් ලූනු අස්වැන්න කි.ග්‍රෑ. 5,411ක් පමණක් විය.

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය පරිදි සැපයුම්කරු සමග ලිඛිත ගිවිසුමකට එළැඹ නොතිබුණි.

දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් අනුමත කළ ක්‍රියාකාරී සැලැසුමට අනුව ප්‍රශස්ත කාලය තුළදී ගොවීන් වෙත ලූණු බල්බ නොලැබීම, අයහපත් දේශගුණික තත්ත්වයන් ආරම්භ වන වගාව සඳහා නුසුදුසු කාලයක ලූනු බල්බ බෙදා හැර ඒවා වගා කිරීමට උපදෙස් දීම, බල්බ වසන්තීකරණය (Verbalization) සිදු කර නොතිබීම, ලද ලූනු බල්බ පිරිවිතරවලට අනුකූල ද හා

ඒවා වගාවට සුදුසු ද යන්න විෂය දැනුමැති නිලධාරියෙකු විසින් පරීක්ෂා කර නොතිබීම යනා දී හේතූන් මත මෙම ව්‍යාපෘතිය මුළුමනින්ම අසාර්ථකව, ඒ වෙනුවෙන් වැය කළ රු. 1,359,500ක් නිෂ්ඵල වී තිබුණි.

### 3.12 වැඩිපුර ගෙවීම්

බළංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටු කළ මාර්ග 03ක් වෙනුවෙන් කළුගල් සඳහා ගෙවීම් කිරීමේ දී ප්‍රවාහන වියදම ඇතුළත් කළ මිල රේටයක් භාවිතා කර තිබුණ ද, එම ගල් ප්‍රවාහනය සඳහා ඊට අමතරව රු. 9,850ක් ද වැඩිපුර ගෙවා තිබුණි.

### 3.13 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 59 | 50 | 09 | - |
| (ii) | තෘතියික මට්ටම | 41 | 20 | 21 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1183 | 1145 | 62 | 24 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 175 | 180 | 05 | 10 |
| (v) | වෙනත් (අනියම්) | - | - | - | - |
| | **එකතුව** | **1458** | **1395** | **97** | **34** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 97ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.